# තවත් පෙරට යමන් නගේ!

## කාන්තා සහභාගිත්වය පිළිබඳ සමීක්ෂණයක්

ශ්‍රී ලංකාව පිහිටීමෙන් හා දේශගුණික ලක්ෂණ වලින් බොහෙවින්ම කෘෂිකාර්මික රටක් වශයෙන් පිළිගෙන ඇත. කෘෂිකර්මය මුල් අවධියේ පටන් පැවැති ආර්ථික රටාව බැව් පැරණි වැව් හා ජල මාර්ග වලින් මොනවට පැහැදිලි කෙරේ. මෙම ආර්ථික ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී වනිතාවට අයිතිවූ තැන තීරණය වූයේ එකල පැවති පවුල් ඒකක සංකල්පය, සාමාජික හා ආගමික දර්ශනය මතය. පවුලේ ප්‍රධානියා පුරුෂයා වූ අතර ඔහුට පවුල නඩත්තු කිරීමේ කාර්යයද සතුවිය. මෙවැනි පිතෘමූලික සමාජයක වනිතාවට කවදත් හිමිවී තිබුණේ දෙවන ස්ථානයයි. මෙසේ සමාජයේ කාන්තාවට හිමි ස්ථානය හා ඇය වෙත පැවරී තිබූ කාර්යය භාරය පිළිබඳව නොයෙක් මත හා විශ්වාසයන් එවකට තිබුනි. මෙයින් සමහරක් මෙසේ සඳහන් කළ හැක.

වනිතාව පිරිමින්ට යටත්ව දූවක, මවක හෝ බිරිඳක වශයෙන් තමන්ගේ කාර්යභාරය ඉටුකළ යුතු ස්ථානය නිවස විය. ඇයට ගෙදරින් විවෘත සමාජ කටයුතු වල හෝ බුද්ධිමය කටයුතු වල යෙදීමට අවස්ථාවක් නොලැබුනි. ගෘහනියක වශයෙන් ආර්ථික කටයුතු වලදී තීරණ ගැනීමට හෝ වගකීම්



තවත් පෙරට යාමට සූදනම්ද?

කරට ගැනීමට ශක්තියක් නොතිබුණි, එමෙන්ම ඇයට අධ්‍යාපනය සඳහාද අවස්ථාව නොසලසන ලදී.

මූලික ආදායම් මාර්ගයවූ කෘෂිකර්ම ක්‍රියාවලියේ දීද මෙම කරුණු බලපාන්නට විය. මෙහිදී බොහෙවින් වනිතාවගේ රාජකාරි කොටස වූයේ නෙලීම පැලසිටුවීම හා පිළිගත් සීමාවන්ට යටත්ව ගොවිතැන සකස් කිරීම වැනිදෑ පමණකි. මේ හැර ගොවිපලේ වැඩ කරන පිරිමින්ට කෑම පිළියෙල කොටගෙන යාම, සහ අතුරු බෝග වගාවෙ හිදී පිරිමින්ට සහාය වීම, ඇයට හිමිව තිබූ අනෙකුත් කාර්යයන් විය. ඇත්ත වශයෙන්ම මෙ ආකාරයෙන් ශ්‍රමය බෙදීම වැඩ වසම් ක්‍රම ආර්ථිකයේ ලක්ෂණයක් වශයෙන් සැලකිය හැක.

නිදහස ලැබීමෙන් පසුවී ගොවිතැන මුල් කරගත් කෘෂි කාර්මික ආර්ථිකයක් මත රට සංවර්ධනය කිරීමට සැලසුම් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් දිවයිනේ නොයෙකුත් ප්‍රදේශවල කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපාරයන් බිහිවී ඇත. මේ සෑම ව්‍යාපාරයකම වැසියන්ට ඉඩම් බෙදා දී ඔවුන්ව කෘෂිකර්මයට නැඹුරු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් එම කටයුතු වල වනිතාවට සහභාගිවීමේ අවස්ථාවන් බහුල විය. එම නිසා පවුලේ ප්‍රධාන ආර්ථික කාර්යය වූ කෘෂිකර්මාන්තයට පිවිසීමට ඇයට සැමියාට උදව් කිරීම තුළින් අවස්ථාව ලැබිණ.

එම හේතූන් නිසා අද වනිතාවට කෘෂිකර්ම ක්‍රියාවලියේදී මෙන්ම ආර්ථිකයේ වෙනත් කාර්ය



මඩ සෝද ගත් ගොවියා රජකමට: උදැල්ල ගත් ගෙවිලිය?

යන්හිදීද; පැරණි යුගයේදී හිමිවී තිබුන තැනට වඩා වෙනස් ස්ථානයක් හිමිවී ඇත.

කෘෂිකර්මාන්ත ව්‍යාපාර වල ජීවත්වන වනිතාවන්ට හිමි තීරණ ගැනීමේ අයිතිය, පිරිමින් සමග වැඩ කිරීමේදී ඇයට වෙන්වන රාජකාරි කොටස, ගෘහනියක වශයෙන් ඇයගේ කාර්යයන් හා සමාජයේ සාමාජිකයෙක් වශයෙන් ඇයට හිමි තැන පිළිබඳව ආර්ථික විශේෂඥයින්, කෘෂිකාර්මික හා සමාජ විද්‍යාඥයින්ගේ අවධානය යොමුවී ඇත. විශේෂයෙන් දියුණුවෙමින් පවතින රටවල මේ සම්බන්ධයෙන් පර්යේෂණ පවත්වා නොයෙක් නොයෙක් මත, යෝජනාවන් ඉදිරිපත් කර තිබේ.

මෑතකදී ගල්ඔය සංවර්ධන ව්‍යාපාරය තුළ පිහිටි සිංහල හා ද්‍රවිඩ ගොවීන් ජීවත් වන ජනපද ඒකක හතරක් තුළ, කෘෂිකර්ම කටයුතු වලදීත් ගෘහිනියක වශයෙනුත්, වනිතාවගේ තත්වය පිළිබඳව පර්යේෂණයක මාර්ගයෙන් කරුණු රැස් කරන ලදී. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ කෘෂිකර්ම ක්‍රියාවලියන්ට ගෙවිලියන්ගේ ඇති සහභාගීත්වය, වී වගාව හා සම්බන්ධ නොයෙකුත් කාර්යයන්ට මොවුන් විසින් වැය කරන කාලය, ගෘහස්ථ ක්‍රියාවලියන්ට ගත කරන කාලය, ගෘහනියක් වශයෙන් ගෘහස්ථ ආර්ථිකය පිළිබඳව හා ගෙවිලියක වශයෙන් කෘෂිකාර්මික ක්‍රියාවලියන් පිළිබඳව තීරණ ගැනීමේ හැකියාව හෝ මෙවැනි තීරණ ගැනීමේදී තම සැමියාට ඇගෙන් ලැබෙන සහයෝගය වැනි කරුණු සොයා බැලීමෙන් ගෘහයෙන් පිටත වෙනත් රැකියා වලට යාම හෝ සමාජීය සංවිධාන වලට ඇයගේ ඇති සහභාගිත්වය වැනි තොරතුරු සෙවීමත්ය.

මෙම ප්‍රදේශයේ පිරිමින්ගේ හා වනිතාවන්ගේ අධ්‍යාපන මට්ටම ගැන අධ්‍යයනය කිරීමේදී දක්නට ලැබුනු ලක්ෂණයක් වූයේ කාන්තාවන්ගේ සාමාන්‍ය අධ්‍යාපන මට්ටම පිරිමින්ගේ අධ්‍යාපන මට්ටමට වඩා ඉහළ තත්වයක පැවතෙන බවයි.

වී වගාවේ ක්‍රියාවලියනට මෙම වනිතාවන්ගේ සහභාගිත්වය ගැන කරුණු සෙවීමේදී වී වගාවට බිම් සකස් කිරීම, ගොයමට රසායනික පොහොර

හා කෘමිනාශක වර්ග යෙදීම වැනි ක්‍රියාවන් තවමත් පිරිමින් අතින් පමණක් සිදුවන කාර්යයන් බව පෙනුනි. එනමුත් බිත්තර වී සූදනම් කර ගැනීම තවාන් පිළියෙල කිරීම වැනි කටයුතු වලදී වනිතාවන්, පිරිමින් සමග කරට කර වැඩ කරන අයුරු පෙනුනි. ලංකා ඉතිහාසයේ, වී වගාවේ වනිතාව අතින් කෙරුණු කාර්යයන් ලෙස සලකණු ලැබූ වල්පැල විනාශ කිරීම, මෙම අධ්‍යයනයේදී බොහෝ විට පිරිමින් අතින් කෙරෙන කාර්යයන් ලෙස පෙන්නුම් විය. මෙයට හේතුව එකල කාන්තාවන් විසින් කරන ලද වල් නෙලීමේ කාර්යය, වල් නාශක වැනි නවීන තාක්‍ෂණ ක්‍රම මගින් ගිල ගැනීම විනා කාන්තා සහභාගිත්වයෙන් හීන වීමක් නොවේ. මෙය පැහැදිලිවම පෙනී ගියේ, සාමාන්‍යයෙන් එක් වනිතාවක් එක් කන්නයකදී මෙම ක්‍රියාවලියේ නියැලී සිටි සාමාන්‍ය දින ගණන ගණනය කිරීමේදී එය, එක් පිරිමියෙක් නියැලී සිටි සාමාන්‍ය දින ගණනට වඩා වැඩි බව පෙන්නුම් කළ බැවිනි.

අස්වනු නෙලීම, නෙලන ලද අස්වැන්න ගොනු කිරීම, හුලං කිරීම වැනි කම්තේදී සිදුවන කාර්යයන් විශාල වශයෙන් කාන්තා සහභාගිත්වයක් යටත් කෙරෙන බව කැපී පෙනුනු ලක්‍ෂණයකි. එහෙත් සැහෙන ශ්‍රමයක් යෙදිය යුතුවූ අස්වැන්න ගෙදරට ප්‍රවාහනය කිරීම වැනි දෑ වැඩි වශයෙන්ම කෙරෙන්නේ පිරිමින් අතිනි. මෙහිදී විශේෂයෙන්ම සඳහන් කළ යුතුව ඇත්තේ මෙම ක්‍රියාවලියන් බොහොමයකදීම සහභාගි වී ඇති ද්‍රවිඩ වනිතාවන් සංඛ්‍යාවේ ප්‍රතිශතය, සිංහල වනිතාවන් සංඛ්‍යාවේ ප්‍රතිශතයට වඩා වැඩි බවයි. එහෙත් මෙම ක්‍රියාවලියන්ට සිංහල හා ද්‍රවිඩ වනිතාවන් වැය කරන කාලයන් සසඳන විට මෙයට ප්‍රතිවිරුද්ධ ස්වරූපයක් පෙන්නුම් කරයි.

කෘෂිකාර්මික කටයුතු පිළිබඳව තීරණ ගැනීමේදී තවමත් පිරිමින් මූලික ස්ථානයක් ගන්නා බව පෙනුනි. ඉඩම ප්‍රශ්න වලදී හෝ බිත්තර වී වර්ග තේරීම, පැල සිටුවීම හෝ වැපිරීම පිළිබඳ තීරණය ගැනීම හෝ වගා ආරම්භය වැනි වැදගත් කෘෂිකාර්මික තීරණ ගැනීමේදී සෑම විටම වාගේ මුල් ස්ථානය පිරිමින් සතු විය. එහෙත් අස්වැන්න අලෙවි කිරීමේදී නිවසේ පරිභෝජනය සඳහා වෙන්කරන ප්‍රමාණය බොහෝ විට තීරණය වී ඇත්තේ වනිතාව විසිනි.

පර්යේෂණ හා පුහුණුකිරීමේ නිලධාරිනි

**හරිප්‍රියා කරුණාරත්න විසිනි**

කෙසේ වුවත් ගෘහනියක් වශයෙන් ගෙදරදෙර ආර්ථික කටයුතු පිළිබඳව තීරණ ගැනීම වනිතාව හිමිකරගෙන ඇති බව මෙහිදී පෙනෙන්නට තිබුණු වැදගත් ලක්ෂණයකි. පවුලේ එදිනෙද ආහාර සඳහා වන වියදම් පිළිබඳව තීරණය කිරීම සියයට පණහක් පමණ සිංහල නිවෙස් වල පිරිමි සහභාගිත්වයක් නොමැතිව, වනිතාවන් අතින් පමණක් සිදුවන බව පෙනුණි. පවුලේ සාමාජිකයන්ගේ ඇඳුම් පැලඳුම් සඳහා මුදල් වෙන්කිරීම, වෛද්‍ය පහසුකම් සඳහා වියදම් දැරීම, දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් කළයුතු වියදම් ආදිය පිළිබඳව, නියැදියෙන් සියයට පනහකට අධික ගණනක් නිවෙස්වල පිරිමි හා වනිතාවන් හවුලේ තීරණය කරන ලද බව පෙන්නුම් විය. ඉතිරි නිවෙස් ගණනින් වැඩි ප්‍රමාණයක මෙවැනි තීරණ වනිතාව විසින් තනිවම ගැනීමට සමත්ව ඇත.

වනිතාවන් ගෙදරදෙරේ කටයුතු වලට අමතරව වෙනත් රැකියාවල් වල නියුක්ත බිම පිළිබඳව සලකා බැලීමේදී පෙනී ගියේ එයට එතරම් විශේෂ ස්ථානයක් නොලැබී ඇති බවයි පොල් අතු විවීම, පැදුරු හා මලු වර්ග විවීම වැනි වෙනත් නොයෙකුත් අත්කම් වැඩෙහි දක්ෂකම් ඇති වනිතාවන් මුණ ගැසුනත් ඔවුන් ඒවායේ නියැලෙන බවක් දක්නට නොලැබුනි. මෙයට හේතුන් වශයෙන් පෙනී ගියේ ඒවාට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීමට ඇති අසීරු තාවයත්, ඒවා අලෙවියේදී මුහුණ පාන්නට වන දුෂ්කරතාවයනුත්ය. මේ නිසා මේ ප්‍රදේශවල ගෙවිලියන්ගේ ජීවිත තවමත් ගෘහයට හා ගොවිපලට පමණක් සීමාවී ඇති බව පෙනුනි.

එහෙත් ග්‍රාමීය මට්ටමේ නොයෙකුත් සමිති හා සංවිධාන වලට මොවුන්ගේ ඇති සහභාගිත්වය සලකා බැලීමේදී පන්සල් ආධාර සමිති, පාසල් සංවර්ධන සමිති වැනි සමිති වල මුලු සාමාජික සංඛ්‍යාවෙන් සියයට පනහකට අධික කොටසක් වනිතාවන් බව පෙනී ගියේය.

17 පිටුවට

(15 පිටුවෙන්)

## නවත් පෙරට . . .

මෙය සිංහල වනිතාවන්ට පම ණක් විශේෂ වූ ලක්ෂණයක් බැව් මෙහිදී අමතක නොකළ යුතුය. එහෙත් ඉහත කී සමිති හැර ග්‍රාමීය මට්ටමේ අනිකුත් සමිති සමාගම් වලට ඇති සහ භාගීත්වය ඉතාමත් දුර්වල විය. මෙහිදී විශේෂයෙන් සඳහන් කළයුතු වන්නේ මෙම ප්‍රදේශ වල සෑම සංවිධානයක්ම වාගේ විවිධ හේතූන් නිසා අඩපණ වී ගොස් තිබුණු බවයි.

ග්‍රාමීය මට්ටමේ සංවිධානයන් මගින්, මෙම වනිතාවන්ට යම් ආර්ථිකමය ප්‍රතිලාභ ලබාදිය හැකි අත්කම්, මැහුම් වැනි කර් මාන්ත හෝ ප්‍රාදේශීය මට්ට මෙන් ලබාගත හැකි අමුද්‍රව්‍ය උපයෝගී කරගත හැකි ගෘහස් ථමය කර්මාන්ත සඳහා අවශ්‍ය අනිකුත් පහසුකම් හා මේ සම් බන්ධයෙන් යම් කිසි පුහුණුවක් ලබාදිය හැකි නම් හෝ, එය ඔවුන්ගේ දියුණුව සඳහා විශේ ෂයෙන් ඉවහල් වන බව පෙනී ගිය කරුණකි,

මෙම කරුණු සියල්ලම සමස් ථයක් වශයෙන් සලකා බලන විට ඉහත සඳහන් කළ ආර්ථික හා සමාජීය කටයුතු වල, වර්ත මාන වනිතාවගේ සහභාගිවීමේ තත්වයන්ගේ හා ප්‍රමාණයන්ගේ වෙනස්කම් ඇතිවී තිබෙන නමුත්, ලංකාවේ පැරණි ආකල් පය වූ කාන්තාව ප්‍රධානතම ආර්ථිකය හා සමාජීය කාර්ය යන් වෙතින් සෑහෙන දුරට දුරස් කර තැබීමේ සමාජ ආකල් පය තවමත් සැලකිය යුතු ප්‍රමා ණයකින් ජනතාව තුළ මුල්බැස පවතින බව පෙන්නුම් කෙරිණ.